**ජපන් රජය සහ බිම් බෝම්බ ඉවත් කිරීමේ ස්විස් පදනම (FSD) අතර**

**ගිවිසුම් අත්සන් කිරීම**

**සැප්තැම්බර් 30, 2011**

ජපන් රජය විසින් උතුරු නැගෙනහිර බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ඩොලර් මිලියන 21.5ක් (රුපියල් මිලියන 2,300 ක්) 2003 වර්ෂයේ පටන් මේ දක්වා ශ්‍රී ලංකා රජයට ලබාදී ඇත. එහි ප්‍රතිඵලයක් විදියට අවතැන් වූ ජනතාවට නැවත පදිංචි වීමටත්, ජීවනෝපාය ක්‍රියාවන් වලට යොමු වීමටත්, කෘෂිකාර්මික කටයුතු වල නිරත වීමටත් අවකාශය ලැබූ බව මම විශ්වාස කරමි.

බිම් බෝම්බ ඉවත් කිරීමේ ස්විස් පදනම (FSD) ට බිම් බෝම්බ ඉවත්කිරීම සඳහා අද ලබාදෙන ආධාර තුලින් වව්නියා සහ මන්නරම දිස්ත්‍රික්කයන්හි 5000 කට අධික ජනතාවට ජීවත් වීමට මෙන්ම ජීවනෝපායී කටයුතු කරගෙන යාමට සුදුසු ආරක්ෂාකාරී පරිසරයක් උදා වනු ඇත. එපමණක්ද නොව මෙම ව්‍යාපෘතිය හරහා 100කට අධික පවුල් සඳහා රැකී රක්ෂා අවස්ථා ද උදාවනු ඇත.

බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති වලට අමතරව යාපනයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම, වවුනියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ විදුලි රැහැන් ඉදිකිරීම මෙන්ම යාපනය සහ මන්නාරම දිස්ත්‍රික්කයන් හි යලි පදිංචි ජනතාව පුනරත්තාපනය කිරීම සඳහාද ශ්‍රී ලංකාවේ වෙනත් සංවර්ධන කටයුතු සඳහාද ජපන් රජය විසින් ආධාර උපකාර ලබාදී ඇත.

නේපාලයේ තානාපති ලෙස වැඩ භාර ගැනීමට මට සිදුවී ඇති බැවින් අද දින ගිවිසුම් අත්සන් කිරීම මගේ අවසාන උත්සව අවස්ථාව වනු ඇත. ශ්‍රී ලංකාවේ වසර දෙකහමාරක මගේ සේවා කාලය දෙස ආපසු හැරී බලද්දී, ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු මෙන්ම ආරක්ෂිත තත්වයද වඩා වැඩි දියුණු වී ඇති බව පැහැදිලිවම දැකගන්න පුළුවන්. කොහොම වුනත් ශ්‍රී ලංකා රජය හා ජනතාවගේ සාමකාමිත්වය සහජීවනය හා යලි ගොඩනැගීමේ කටයුතු සඳහා දක්වන උත්සාහය දිගටම පවත්වාගෙන යනු ඇතැයිද මම විශ්වාස කරමි. ඒ සඳහා ජපන් රජයත් නිරතුරුවම ශ්‍රී ලංකා රජයට සහයෝගය ලබාදෙනු ඇත.

අවසාන වශයෙන් බිම් බෝම්බ ඉවත් කිරීමේ ස්විස් පදනම (FSD) ට මෙම ආරම්භය සම්බන්ධයෙන් මම සුභ පතන අතරම, මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිමා කරනු ඇතැයි ද, තිරසාර සාමය, සංවර්ධනය මෙන්ම සමගිය උදා කරලීම සඳහා මෙම ව්‍යාපෘතිය නිරතුරුවම දායක වනු ඇතැයි ද මම විශ්වාස කරමි.